# නිතර අසන අධ්‍යාපනික ප්‍රශ්න

අධ්‍යාපන අංශයෙන් නිතර අසන ප්‍රශ්න සහ ඒවාට අදාල විසඳුම් පහත දැක්වේ.

**1 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ වෘත්තීය සුදුසුකම් විෂයමාලාව ලබාගන්නේ කෙසේද?**

* ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ විකුණුම් කවුළුවෙන් මෙම විෂයමාලාව මිලදී ගත හැකිය.
* වරලත් ගණකාධිකාරී ආයතනයේ විෂයමාලාව පිටපත් ඔබගේ පරිහරණ පහසුව සඳහා පුස්තකාලයේ තබා ඇත.
* ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ වෙබ් අඩවියට පිවිසීමෙන් ද ඔබට අදාළ විෂයමාලා භාගත කළ හැකිය.

  www.casrilanka.com > ශිෂ්‍ය/ශිෂ්‍යාවන් > විෂයමාලාව > curriculum 2015
* 2015 විෂයමාලාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ශිෂ්‍ය අත්පොතෙහි දක්වා ඇත.

**2. මා හට ලිඛිත විභාගයට පෙනී සිටිය හැකිද?**

අදාළ විභාග නිර්ණායකයන් සම්පූර්ණ කිරීම හා දැනුම් ඒකකයේදී ප්‍රශ්න පත්‍ර පදනම් කරගත් විභාගයකට සහභාගී වීමට සිසුන්ට අවසර ලබා දෙයි. පූර්ණකාලීන අධ්‍යයන කටයුතුවල නිරත නොවන ශිෂ්‍යයන් විසින් ඵලදායී ලෙස විභාගයට සූදානම් වීමට හා විභාග සාර්ථකත්වය සඳහා ප්‍රශ්න පත්‍ර පදනම් කර ගත් (ලිඛිත) සුදුසුකම් සම්පූර්ණ කරන ලෙස තරයේ අවවාද කරනු ලැබේ.

**3. මා හට ලබා ගත හැකි අධ්‍යයන ප්‍රකාශන මොනවාද?**

ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පහත දැක්වෙන අධ්‍යයන උපකාරක ලබා ගත හැකිය.

- අධ්‍යයන ග්‍රන්ථ
- පුහුණු සහ පුනරීක්ෂණ කට්ටල
- ආදර්ශ ප්‍රශ්න පත්‍ර
- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර

අධ්‍යයන ග්‍රන්ථයන්හි ඇතුළත් තොරතුරු ඉතා ප්‍රවේශමෙන් කියවා ඒවාහි මාතෘකා සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීම පමණක් නොව සිසුන් විසින් ඒවාහි ඇති ශිල්ප ක්‍රම, ඉගෙන ගන්නා ලද මූලධර්ම වලට ආදේශ කිරීම ඉතා වැදගත් වේ.

මේ සඳහා සිසුන් විසින්,

* අධ්‍යයන ග්‍රන්ථයන්හි පරිච්ඡේද තුළ දක්වා ඇති දෙන ලද සියළුම උදාහරණ ඔස්සේ ක්‍රියා කරමින් ලබා දී ඇති විසඳුම් පරීක්ෂා කරමින් සිසුන් විසින් ඒවා අවබෝධ කරගත් බවට සහතික වීම.
* අධ්‍යයන ග්‍රන්ථයන්හි ඇති සෑම පරිච්ඡේදයකම ඇති ප්‍රගති සමාලෝචන සම්පූර්ණ කිරීම.

මෙයට අමතරව සිසුන් විසින් පුහුණු සහ පුනරීක්ෂණ කට්ටල භාවිත කළ යුතුය. මෙම ප්‍රශ්න මගින් සිසුන්ගේ පුනරීක්ෂණ අවධියේ දී ඔවුන්ට විභාගයට අවශ්‍ය මනා පුහුණුවක් ලැබේ.

## 4 . මා අදාළ අධ්‍යයන ග්‍රන්ථ මිලදී ගන්නේ කෙසේද?

* ඔබට මේ සඳහා පිටපත් තුනකින් යුක්ත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ බැංකු තැන්පතු පත්‍රිකා භාවිත කිරීම අවශ්‍ය වේ.

  1 බැංකු පිටපත
  2 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පිටපත
  3 ශිෂ්‍ය පිටපත

* අදාළ මුදල් ගෙවීම් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුමට බැරවන සේ සිදු කළ යුතුය. ( එක් එක් අධ්‍යයන අදියර වලට අදාළ තැන්පතු කේතයන් තැන්පතු පත්‍රිකාවේ පසුපිට සඳහන් කර තිබේ.)
* ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පිටපත ග්‍රන්ථ අලෙවි කවුළුවට ඉදිරිපත් කිරීමෙන් අදාළ අධ්‍යයන ග්‍රන්ථ (Study Texts) ලබා ගත හැකිය.
* ඔබගේ අධ්‍යයන ග්‍රන්ථ ප්‍රකාශන කට්ටල ශ්‍රී ලංකාව පුරා ස්ථාපිත ඕනෑම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ශාකාවකින් ලබා ගත හැකිය.
* පුහුණු සහ පුනරීක්ෂණ කට්ටල වල මෘදු පිටපත භාවිත කිරීමේ අවසරය අධ්‍යයන ග්‍රන්ථ මිලදී ගැනීමෙන් පසු ඔබට නොමිලේ හිමි වේ.

**5. අධ්‍යයන ග්‍රන්ථවල මිළ ගණන් කෙසේද?**

කරුණාකර පහත වෙබ් අඩවිය පරිශීලනය කරන්න.

www.casrilanka.com > ශිෂ්‍ය/ශිෂ්‍යාවන් > අධ්‍යාපන අංශය >අධ්‍යයන ග්‍රන්ථවල මිළ ගණන්

**6 . අධ්‍යයන ග්‍රන්ථ ලබා ගත හැකි අවසාන දිනය කවදාද?**

ඕනෑම විෂයක් සඳහා පළමුවරට අයදුම් කරන ශිෂ්‍යයන් විසින් විභාග ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සතියකට පෙර (අවම වශයෙන්) මුදල් ගෙවා අධ්‍යයන ප්‍රකාශන ලබා ගත යුතුය.

**සිසුන් විසින් සිදු නොකළ යුතු දෑ**

- විභාග අවසාන දින තෙක් අධ්‍යයන ග්‍රන්ථ ලබා නොගැනීම.
- ප්‍රතිඵල නිකුත් වීමෙන් පසු අධ්‍යයන ග්‍රන්ථ මිලදී ගැනීමට බලා සිටීම.
- විභාග අයදුම් පත්‍රය සමග අධ්‍යයන ග්‍රන්ථ තැන්පතු පත්‍රිකා ඇමිණීම.
- මුදල් තැන්පතු පත්‍රිකාවේ වැරදි තැන්පතු කේතයන්/ තැන්පතු අගයන් ඇතුළත් කිරීම.

පාඨමාලාව ආරම්භයේදීම ඔබගේ අධ්‍යයන ග්‍රන්ථ ලබා ගෙන ඔබගේ අධ්‍යයන කටයුතු සැලසුම් කිරීම සහ වැඩසටහන අතරතුරදී විභාග ප්‍රශ්න පුහුණු වීම් සිදුකරන ලෙස නිර්දේශ කර තිබේ.

මුදල් ගෙවා මාස 06 ක් ඇතුලත අධ්‍යයන ග්‍රන්ථය ලබාගෙන තිබිය යුතු අතර, එසේ ලබා නොගන්නේ නම් ලබාදෙන උපරිම කාලය වූ මාස 06 න් පසුව නැවත අධ්‍යයන ග්‍රන්ථය මිළදී ගන්නේ නම් යලිත් අදාල මුදල ගෙවීමට සිදුවේ.

**7. විෂය මාලාවේ වෙනස්කම් සිදු වූ පසු නැවත අධ්‍යයන ග්‍රන්ථ මිලදී ගත යුතුද?**

ඔබ පැරණි විෂයමාලාව යටතේ  අධ්‍යයන ග්‍රන්ථ මිලදී ගෙන තිබේ නම් විෂයමාලාව (අධ්‍යයන පටිපාටිය) වෙනස් වූ විටදී විභාගයට සුදුසුකම් ලැබීමේ නිර්ණායකයක් වශයෙන් අධ්‍යයන ග්‍රන්ථ නැවත මිලදී ගැනීම අනිවාර්ය නොවේ.

(වැඩි දුර විස්තර සඳහා පිවිසෙන්න: විෂයමාලාවේ තාවකාලික මාරු කිරීම් පිළිබඳ විධිවිධාන (Transitional Arrangements in Curriculum 2015)

කෙසේ වෙතත් සංශෝධිත අධ්‍යයන ග්‍රන්ථ පරිශීලනය කරමින් විභාගයට සූදානම් වන ලෙසට නිර්දේශ කරනු ලැබේ.

**8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ලබාගන්නේ කෙසේද?**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ වෙබ් අඩවියට පිවිසීමෙන් පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර භාගත කළ හැකිය.

www.casrilanka.com > ශිෂ්‍ය/ශිෂ්‍යාවන් > විභාග > පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර

**9. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් අනෙකුත් සුදුසුකම්වලට ලබාදෙන විෂයය නිදහස් කිරීම් මොනවාද?**

වැඩි දුර විස්තර සඳහා විෂය නිදහස් කිරීම් සම්බන්ධයෙන් 'නිතර අසන ප්‍රශ්න' වෙත පිවිසෙන්න.

www.casrilanka.com > ශිෂ්‍ය/ශිෂ්‍යාවන් > අධ්‍යාපන අංශය > නිදහස් කිරීම් සම්බන්ධයෙන් 'නිතර අසන ප්‍රශ්න'

**10. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පුස්තකාලය විවෘතව පවතින වේලාවන් කවරේද?**

අඟහරුවාදා සිට ඉරිදා දක්වා (පෙ:ව: 08 සිට රාත්‍රී 07 දක්වා)

සඳුදා, පොහොය දිනයන් සහ වෙළඳ නිවාඩු දිනයන්වලදී පුස්තකාලය වසා තැබේ

**11 . ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ වෙබ් අඩවියෙහි අධ්‍යාපන අංශයේ දැන්වීම් ප්‍රදර්ශනය වන්නේ කවර ස්ථානයකද ?**

www.casrilanka.com > ශිෂ්‍ය/ශිෂ්‍යාවන් > අධ්‍යාපන අංශය > දැන්වීම්

**12 . KC 5 වැඩමුළුවට සහභාගී වන්නේ කෙසේද?**

විභාග පැවැත්වීමට පෙර KC 5 වැඩමුළු සංවිධානය කිරීම අධ්‍යාපන අංශය මගින් සිදු කරයි.

E-mail, වෙබ් අඩවි දැන්වීම් වැනි විවිධාකාර සන්නිවේදන ක්‍රම ඔස්සේ මේ පිළිබඳව සිසුන් දැනුවත් කරනු ලැබේ.

**13. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ලියාපදිංචි ඉගෙනුම් මධ්‍යස්ථාන (Teaching College) මොනවාද ?**

www.casrilanka.com > ශිෂ්‍ය/ශිෂ්‍යාවන් > අධ්‍යාපන අංශය > ලියාපදිංචි ඉගෙනුම් මධ්‍යස්ථාන

**14. වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ විය හැක්කේ කෙසේද?**

වැඩිදුර විස්තර සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ශිෂ්‍ය සම්බන්ධතා මධ්‍යස්ථානය හා සම්බන්ධ වන්න.

දුරකතන අංකය 011-2352000 ( දිගුව : 1110,1109)